www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# යුරෝපීය මාධ්‍ය මුස්ලිම් විරෝධී කාටුන් පල කරයි: ගනන් බලා සිදු කල කැත ප්‍රකෝපකරනයක්

## European media publish anti-Muslim cartoons: An ugly and calculated provocation

**කර්තෘ මන්ඩලය විසිනි**
**2006 පෙබරවාරි 4**

මහම්මද්තුමා ත්‍රස්තවාදියකු හා ඝාතකයකු ලෙස හුවා දක්වමින් යුරෝපීය පුවත්පත් මාලාවක් විසින් අපහාසාත්මක කාටුන් පල කිරීම, *ලෝක සමාජවාදී වෙබ් අඩවිය*, පැහැදිලිව ම හෙලා දකී. මුස්ලිම් ආගමික හැඟීම් අවලාදයන්ට ලක් කිරීමේ හා ඇවිස්සීමේ අභිප්‍රායෙන් යුත් මෙම අශිෂ්ට විකට චිත්‍ර දේශපාලනික ප්‍රකෝපකරනයකි. ජර්මානු හා ඉතාලි ෆැසිස්ට්වාදයන් සමග ඓතිහාසිකව බැඳුනු දක්ෂිනාංශික ඩෙන්මාර්ක් පුවත්පතක මුලින් ම පල වූ මෙම කාටුන් ප්‍රකාශයට පත් කිරීම මුස්ලිම් විරෝධී හා ආගමනික විරෝධී මනෝගතීන් අවුලුවාලීම පිනිස ගනන් බලා කෙරුනු ක්‍රියාවකි.

මුලින්ම මෙම කාටුන් පල කල පුවත්පත ආරක්ෂා කිරීමට දක්ෂිනාංශික ඩෙන්මාර්ක් ආන්ඩුව ගත් තීන්දුවටත් ඒවා යලි පල කිරීමට නෝර්වේ රටේ, ප්‍රන්සයේ, ජර්මනියේ, ස්පාඤ්ඤයේ, ඉතාලියේ, බෙල්ජියමේ, නෙදර්ලන්තයේ, ස්විස්ටර්ලන්තයේ, අයිස්ලන්තයේ හා හංගේරියාවේ තත්වාරක්ෂක හා ලිබරල් යන දෙවර්ගයේ ම පුවත්පත් ගත් තීන්දුවටත් පුවත්පත් නිදහස හෝ නිර්-ආගමිකවාදය ආරක්ෂා කිරීම සමග මොන යම් හෝ සම්බන්ධයක් නැත. එවන් කියාපෑම් මෙම ප්‍රජාතන්ත්‍රවාදී මූලධර්මයන් විකාරයක් බවට පත් කරයි.

ඒ වෙනුවට, එවන් උන්මාදනීය දහ ජරාව පතුරුවාලීම බැඳී පවතින්නේ, මැද පෙරදිග හා මධ්‍යම ආසියාවේ එක්සත් ජනපද අධිරාජ්‍යවාදයේ නව-විජිතවාදී මැදිහත්වීම් පිටුපසින් වඩා දෘඩතර ලෙස පෙල ගැසීම පිනිස යුරෝපීය පාලක ප්‍රභූන් විසින් ගනු ලැබ ඇති හැරීම සමග ය. ඉරාකයේ දැන් සිදු වන ජන ඝාතන, පලස්තීන ජනතාවට එරෙහි නව තර්ජනය සහ ඉරානයට එරෙහිව තහංචි සහ අවසානයේ මිලිටරි ආක්‍රමනයක් සඳහා යන සූදානම මධ්‍යයේ මෙය සිදු වීම අහම්බයක් නොවේ.

එමෙන් ම, එය වනාහි, වැඩෙන මුස්ලිම් ජනගහනය යක්ෂයන් ලෙස හුවා දැක්වීමත් ඔවුන් හුදකලා කිරීමත් කම්කරු පන්තියේ පුලුල් ස්තරවලට බලපාන වැඩෙන සමාජ කාලකන්නිකම සඳහා දඩමීමුන් ලෙස එම මුස්ලිම් ජනයා යොදා ගැනීමත් පිනිස, යුරෝපයේ දේශපාලන දක්ෂිනාංශය විසින් නාමික* වමේ පක්ෂවල ඍජු හා වක්‍ර ආධාරය යටතේ හිතාමතාම ඉදිරියට තල්ලු කරනු ලබන පිලිවෙතක අඛන්ඩතාව මෙන් ම උත්සන්න කිරීමක් ද වේ.

යුරෝපය පුරා ආන්ඩු, ත්‍රස්තවාදයට එරෙහි සටනේ නාමයෙන්, සමස්තයක් ලෙස කම්කරු පන්තියේ ප්‍රජාතන්ත්‍ර අයිතීන් විනාශ කිරීම සඳහා පදනම සූදානම් කරන අතර ම, පලමු කොට ම, මුස්ලිම් හා සෙසු ආගමනික ජනගහනයන් ඉලක්ක කර ගත් මර්දනකාරී පියවර ක්‍රියාවට දමයි. මෙම පොලිස් රාජ්‍ය සූදානම කම්කරු ජනයාගේ රැකියා, වැටුප් හා ජීවන කොන්දේසි මත එල්ල කෙරෙන ප්‍රහාරයක් ද සමාජයේ ඉහල සිටින ධනවත් හා වරප්‍රසාදිත සුලුතරයක සේප්පු තුල ධනය වඩා වඩා සංකේන්ද්‍රනය වීමක් ද සමග අත්වැල් බැඳ ගනී.

පෙරදිග යක්ෂ සේනාවන්ට විරුද්ධව බටහිර නිර්-ආගමික වටිනාකම් ආරක්ෂා කරන බවට කියාපාන මාධ්‍ය ප්‍රකාශන විසින් ඔවුන්ගේ මූනට දමා ගසන වර්ගෝත්තමවාදී චිත්‍ර කෙරෙහි සිය වෛරය ප්‍රකාශ කර ඇති ලොව වටා මුස්ලිම් ජනයාගේ සාධාරන කෝපය සමග සහානුමතික වන පිනිස ඉස්ලාම් ධර්මය හෝ වෙනත් ආගමක් පිලිගැනීමට ම අවශ්‍ය නැත.

කාටුන් පල කිරීමට එරෙහි විරෝධතා ව්‍යාපාර සිකුරාදා මැද පෙරදිග, උතුරු අප්‍රිකාව සහ ආසියාව පුරා පැතිර ගියේ ය. ඉරාකයේ දහස් ගනන් ද බටහිර ඉවුරේ හා ගාසා තීරයේ දසදහස් ගනනින් ද විරෝධතා දැක්වූ අතර සූඩානයේ අගනුවර වන ඛාටොම්හි චතුරස්‍රයකට 50,000ක් රැස් වූහ. බ්‍රිතාන්‍යයේ හා තුර්කියේ මුස්ලිම්වරු ද විරෝධතා පැවැත්වූහ.

වත්මන් ගැටුමට තුඩු දී ඇති සිද්ධීන් මගින් පැහැදිලි කෙරෙන්නේ, කාටුන් පල කිරීම දේශපාලනික ප්‍රකෝපකරනයක් බව යි. ප්‍රථම වරට සැප්තැම්බර් 30 දා මහම්මද්තුමාගේ විකට චිත්‍ර 12ක් පල කල ජිලාන්ඩ්ස්-

පොස්ටන් නම් ඩෙන්මාර්ක් දිනපතා පත්‍රය, අගමැති ඇන්ඩර්ස් ෆොග් රස්මුසෙන්ගේ නායකත්වයෙන් යුත් දක්ෂිනාංශික ආන්ඩුවට සහයෝගය දෙයි. එය වනාහි උන්මාදනීය ලෙස ආගමනික විරෝධී හා මුස්ලිම් විරෝධී පිලිවෙතක් දරන පක්ෂයක් සිය සභාගය තුලට එක් කර ගෙන සිටින ආන්ඩුවකි.

1920 ගනන් හා 1930 ගනන්වල දී, *ජිලාන්ඩ්ස්-පොස්ටන්* පත්‍රය ඉතාලි ෆැසිස්ට්වාදය හා ජර්මානු නාසි ආඥාදායකත්වය සමග සබඳතා පැවැත්වීම සම්බන්ධයෙන් කුප්‍රකට විය. 1933 දී, එය ඩෙන්මාර්කයේ ආඥාදායකත්වයක් ඇති කල යුතු යැයි තර්ක කලේ ය.

පසු ගිය සැප්තැම්බරයේ දී, මෙම පුවත්පත මහම්මද්තුමාගේ රූප අඳින ලෙස කාටුන් ශිල්පීන් 40 දෙනෙකුගෙන් ඉල්ලා සිටියේ ය. එවන් චිත්‍ර ඇඳීම වනාහි ආගමික අපහාසයක් ලෙස ඉස්ලාම් ධර්මය විසින් තහනම් කරන ලද ක්‍රියාවකි. මෙම අභ්‍යාසයේ පැවති ප්‍රකෝපකාරි හා අවුස්සන සුලු එල්ලය ප්‍රකාශයට පත් කරමින්, පුවත්පතේ ප්‍රධාන කර්තෘ කියා සිටියේ එහි අරමුන වූයේ "මුස්ලිම් ආගම සම්බන්ධ අන් කාරනාවල දී අප දක ඇති පරිදි, මිනිසුන් ස්වයං-වාරනයට යටත් වනු ඇත්දැයි පරීක්ෂා කිරීම" බව යි.

පුවත්පත කාටුන් 12ක් පල කිරීමට කටයුතු කලේ ය. මහම්මද්තුමා දුම් දමන බෝම්බයක හැඩය සහිත ටර්බන් එකකින් සැරසී සිටින ආකාරය පෙන්නුම් කරන කාටුන් එකක්, මහම්මද්තුමා දිව්‍ය ලෝකයේ වලාකුලක් මත සිටිමින් ඔවුන්ට තෑගි පිනිස දීමට ඇති කන්‍යාවන් අවසන් වී ඇතැයි එහි වැල නොකැඩී එන මරාගෙන මැරෙන බෝම්බකරුවන්ට පවසන අයුරු දක්වන තවත් කාටුනයක් සහ මහම්මද්තුමා පිහියක් අතැතිව එක් පසෙක හොඳින් මුහුන ආවරනය කර සිටින කාන්තාවක් ද සහිතව විරීත්තමින් රෞද්‍ර විලාසයකින් සිටින ආකාරය දක්වන තෙවන කාටුනයක් ද ඒ අතර විය.

ඔක්තෝබරයේ දී, මෙම කාටුන් පිලිබඳ සිය විරුද්ධත්වය පිලිබඳව සාකච්ඡා කරනු පිනිස අවස්ථාවක් ඉල්ලා සිටි මුස්ලිම් බහුතරයකින් යුත් රටවල් 11ක තානාපතිවරු හමුවීම අගමැති රස්මුසෙන් ප්‍රතික්ෂේප කලේ ය. රස්මුසෙන්, ඉන් අනතුරු වර්ධනයන් සඳහා තානය සකසමින්, කාටුන් වනාහි පුවත්පත් නිදහසෙහි යුක්තියුක්ත භාවිතයක් බව ප්‍රකාශ කල අතර ඒ ගැන සාකච්ඡා කිරීමට දෙයක් නැති බව ද ඇඟවී ය.

ජනවාරියේ දී නෝර්වේජියානු සඟරාවක් මෙම කාටුන් පල කිරීමත් සමග අවමානය තව දුරටත් වර්ධනය විය. ජනවාරි අග වන තෙක් ම, එනම්, සවුදි අරාබිය හා සිරියාව ඩෙන්මාර්කයෙන් සිය තානාපතිවරු ආපසු කැඳවන සහ සවුදි තන්ත්‍රය ඩෙන්මාර්ක් භාන්ඩ පාරිභෝජනය වර්ජනය කිරීමක් දියත් කරන තෙක් ම, ඩෙන්මාර්කය එරට මුස්ලිම් කන්ඩායම් සහ සෙසු මුස්ලිම් සංවිධාන මතු කල විරෝධතා දිගට ම නොතකා සිටියේ ය.

ඩෙන්මාර්ක් ආන්ඩුව සහ *ජිලාන්ඩ්ස්-පොටෙන්* පත්‍රය, කාටුන් පල කිරීමේ තීන්දුව ආරක්ෂා කරන ගමන් ම, කනගාටුව ප්‍රකාශ කරන නිවේදන නිකුත් කලේ, භාන්ඩ වර්ජනය පැතිර ගොස් යුරෝපයේ දෙවන විශාලතම කිරි නිෂ්පාදකයා වන අර්ලා ෆුඩ්ස් නමැති ඩෙන්මාර්ක් සමාගම සිය මැද පෙරදිග අලෙවි කටයුතු මුලුමනින් ම සිඳී ගොස් ඇතැයි නිවේදනය කල පසු ම පමනි.

ප්‍රන්ස පුවත්පතක් වන *ෆ්‍රාන්ස් ස්වාර්* කාටුන් පල කිරීමත් සමග ම මෙම සතියේ කැකෑරෙන මතභේදය පුපුරා ආවේ ය. බ්‍රහස්පතින්දා කලාපයේ කතුවැකියක කාටුන් පල කිරීමේ සිය තීන්දුව ආරක්ෂා කරමින් පුවත්පතේ කර්තෘ මෙසේ ලිවී යː "මෙම ප්‍රතිගාමී ආගමික උම්මත්තකයන්ගෙන් තව දුරටත් පාඩම් අවශ්‍ය නැත."

ලිබරල් *ලිබරේෂන්* පත්‍රය ඇතුලු ප්‍රන්සයේ සෙසු පුවත්පත් ද කැත කාටුන්වලින් කොටසක් හෝ සියල්ල ම පල කරමින් එම පිලිවෙත අනුව ගියේ ය. *ල මොන්ඩේ* පත්‍රය, ඔවුන්ගේ පාර්ශ්වයෙන්, "මා මහම්මද්තුමාව චිත්‍රයට නොනැගිය යුතු යි" යනුවෙන් සඳහන් වැකිවලින් සැදුනු -- මහම්මද්තුමා යැයි අනුමාන කල හැකි -- මිනිසකුගේ රේඛා චිත්‍රයක් පල කලේ ය.

*ඩයි වෙල්ට්, ඩයි ටගෙස්සෙයිටුං, ටගෙස්පීගල්* හා *බර්ලිනර් සෙයිටුං* යන ජර්මානු පුවත්පත්, *වොල්ක්ස්ටරාන්ට්, එන්ආර්සී හැන්ඩල්ස්බ්ලාඩ්* හා *එල්සෙවියර්* යන ලන්දේසි පුවත්පත්, ඉතාලියේ *ලා ස්ටම්පා* හා *කොරියර් ඩෙලා සෙරා* යන පුවත්පත්, ස්පාඤ්ඤයේ *එල් පීරියොඩිකො* සහ බෙල්ජියමේ ලන්දේසි භාෂාවෙන් පල කෙරෙන පුවත්පත් දෙකක් පසුගිය දින ගනනාව තුල මෙම කාටුන්වලින් කොටසක් හෝ සියල්ල පල කල පුවත්පත් අතර විය.

බ්‍රිතාන්‍යයේ බීබීසී, අයිටීවී සහ චැනල් 4 යන ආයතන රූපවාහිනී ප්‍රවෘත්ති විකාශනවල දී කාටුන්වලින් සමහරක් ප්‍රදර්ශනය කලේ ය.

වර්ගෝත්තමවාදී විකට චිත්‍ර ප්‍රවාහය පිටුපස ඇති දේශපාලන බලවේග සහ අභිප්‍රායන් පිලිබඳ දර්ශකයක් වූයේ, කාන්තාවන්ට බුර්කා පැලඳීම තහනම් කරන නීතියක් ගෙන ඒමට යෝජනා කර ඇති ලන්දේසි පාර්ලිමේන්තු සභිකයකු වන ග්‍රීට් විල්ඩර්ස්," ඩෙන්මාර්ක් කාටුන් ශිල්පීන්ට පිදෙන සංකේතාත්මක සහයෝගයක් ලෙස හා නිදහස් කථනය වෙනුවෙන් නැගී සිටීම

පිනිස" සිය වෙබ් අඩවියේ කාටූන් පල කිරීමට ගත් තීන්දුවයි.

කාටූන් පල කල මාධ්‍ය ප්‍රකාශනවල සහ ඩෙන්මාර්ක් ආන්ඩුවේ ආරක්ෂාව පිනිස පැන ගෙන ඇති යුරෝපීය දේශපාලනඥයන් හා ආන්ඩුවේ නිලධාරීන් අතරට ප්‍රන්ස අභ්‍යන්තර කටයුතු ඇමති නිකොලස් සර්කොසි ද එක්ව ඇත. ඒ ප්‍රදේශවල වැසියන් "කුනු කන්දල්" සහ "ශරීර වණ" ලෙස සඳහන් කරමින් පසු ගිය වසරේ ප්‍රන්සයේ විශාල වසයෙන් මුස්ලිම් ආගමනිකයන්ගෙන් සමන්විත උපනගර ප්‍රදේශවල පොලීසියට එරෙහි කැරලි අවුලුවාලීමට උදව් කල මේ මිනිසා, පරමසාරයෙන් ම නරුමත්වයකින් යුක්තව, දැන් මුස්ලිම් ජනයාට එරෙහි තවත් ප්‍රහාරයකට සහයෝගය දීම පිනිස පුවත්පත් නිදහසේ ආවරනය පැලඳගෙන ඇත.

ප්‍රන්සයේ සිවිල් නිදහස කප්පාදු කර ඇති වත්මන් හදිසි නීතියේ නිර්මාතෘ වන සර්කොසි, මෙම ප්‍රජාතන්ත්‍ර විරෝධී ප්‍රහාරය ප්‍රජාතන්ත්‍රික කඩතුරාවකින් ආවරනය කිරීමේ මුග්ධ ප්‍රයත්නයට, ආදර්ශයක් සපයා ඇත. සර්කොසිගේ හා ජනාධිපති ජැක් චිරාක්ගේ ප්‍රන්ස ආන්ඩුව, සමාජවාදී හා කොමියුනිස්ට් පක්ෂවල ද "වඩා වමෙන්" සිටින ලුතේ ඔවරියර් (කම්කරු අරගල) සංවිධානයේ ද සහයෝගය ඇතිව, රජයේ පාසල්වල මුස්ලිම් දැරියන් හිස් ආවරන පැලඳීම තහනම් කරන නීතියක් පැනවීම මගින්, මෙවන් මුස්ලිම් විරෝධී ප්‍රහාරවලට පූර්වාදර්ශය සැපයී ය. පොදුවේ ආගමික නිදහසට ද විශේෂයෙන් ම මුස්ලිම්වරුන්ගේ අයිතීන්වලට ද එරෙහි මෙම විවෘත ප්‍රහාරයත් එසේම නොතකා හැරියේ නිර්-ආගමිකවාදය සහ ප්‍රන්ස ජනරජයේ "ප්‍රබුද්ධ" වටිනාකම් ආරක්ෂා කිරීමක් ලෙස යි.

පසුගිය වසරේ කැරලිවලින් අනතුරුව සර්කොසිගේ මූලිකත්වයෙන් ගෙන එන ලද නීතියක් යටතේ ප්‍රන්ස මුස්ලිම්වරු මහා පරිමානයෙන් රටින් පිටුවාහල් කිරීමේ ප්‍රථම රැල්ල තුල, නිර්-ආගමිකවාදය හා පුවත්පත් නිදහස සඳහා යැයි කියනු ලබන මෙම ශුද්ධ වූ මෙහෙයුමේ සැබෑ අන්තර්ගතය පෙන්නුම් කෙරුනි. මෙම නීතිය යටතේ අපරාධ සම්බන්ධයෙන් අධිචෝදනා ලැබූ -- වරදකරුවන් නොකෙරුනු -- සියලු විදේශිකයන් වහාම පිටුවාහල් කල හැකි ය. කැරලි පැවති කාලය තුල සර්කොසිගේ කැරලි මර්දන පොලීසිය විසින් තරුනයන් සිය ගනනින් අත් අඩංගුවට ගත් අතර ඔවුහු දැන් රටෙන් පිටුවාහල් කිරීමේ තර්ජනයට මුහුන දී සිටිති.

ඇන්ජෙලා මර්කෙල්ගේ නායකත්වයෙන් යුත් නව මහා සන්ධාන ආන්ඩුව ද එලෙස ම ජර්මානු භූමියෙන් විදේශිකයන් පලවා හැරීමේ වඩා බලගතු පිලිවෙත් ඉල්ලා ඇත.

එක්සත් ජනපද අධිරාජ්‍යවාදය වෙනුවෙන් ඇෆ්ඝනිස්ථානය තුල පොලිස්කාරකම්වලට සහාය වීම පිනිස අමතර හමුදා යැවීමේ සැලසුම් නෙදර්ලන්තය විසින් නිවේදනය කිරීම මගින් මුස්ලිම් විරෝධී ප්‍රහාරය පිටුපස පවත්නා විදේශ පිලිවෙත් අවශ්‍යතා පෙන්නුම් කෙරුනි.

සිකුරාදා එක්සත් ජනපද රාජ්‍ය දෙපාර්තමේන්තුව කාටූන් පල කිරීමට විරුද්ධව නිවේදනයක් නිකුත් කලේ ය. "මෙම කාටූන් ඇත්ත වසයෙන් ම මුස්ලිම් ජනයාගේ විශ්වාසයන්ට එල්ල කෙරුනු ප්‍රහාරයක්" බව සඳහන් කල දෙපාර්තමේන්තු ප්‍රකාශකයෙක් තව දුරටත් මෙසේ ද පැවසී යː "අපි පුවත්පත් නිදහසට සහ අදහස් ප්‍රකාශ කිරීමේ නිදහසට මුලුමනින් ම ගරු කරමු. එහෙත් එය පුවත් පත්වල වගකීම සමග එකට යා යුතු ය. මේ ආකාරයෙන් ආගමික හෝ ජනවාර්ගික වෛරය ඇවිලවීම පිලිගත නොහැකි ය."

ඇමරිකානු පුවත් පත් මර්දනය කිරීමට නැවත නැවතත් උත්සාහ කර ඇත්තා වූත් එක්සත් ජනපදය තුල මුස්ලිම් ජනයාට එරෙහිව මෘග ප්‍රහාර එල්ල කර ඇත්තා වූත් ආන්ඩුවකින් කෙරුනු මෙම මැදිහත්වීම මුලුමනින් ම කුහක ය. බුෂ් පාලනාධිකාරය, 9/11 ත්‍රස්ත ප්‍රහාරවලින් අනතුරුව, ඊනියා "ත්‍රස්තවාදයට එරෙහි යුද්ධය" කඩතුරාව ලෙස යොදා ගනිමින්, ලොව පුරා මුස්ලිම් ජනයාට විරුද්ධව ප්‍රහාරය මෙහෙයවා ඇත.

මිලිටරි හා රහස් ඔත්තු සේවා නිලධාරීන් මුස්ලිම් විශ්වාසයන් හා මනෝගතීන් ගසාකෑමේ සැලසුම්සහගත උපායන් යොදා ගත් ඉරාකයේ අබු ග්‍රේබ් සිර කඳවුරේ දී සිරකරුවන් ලිංගික අපචාරයන්ට නතු කෙරෙන ආකාරය දක්වන ඡායාරූප මගින් ලෝකයේ ම ඇස් ඉදිරියේ මුස්ලිම් ජනයාගේ විශ්වාසයන්ට වොෂිංටනය දක්වන "ගරුත්වය" එලිදරව් විය.

කාටූන් පල කිරීම සම්බන්ධයෙන් එක්සත් ජනපදයේ නිල ප්‍රතිචාරය බොහෝ සෙයින් මෙහෙයවනු ලැබ ඇත්තේ මෙම ප්‍රකෝපකරනය ඉරාකයේ, ඉරානයේ හා සෙසු ප්‍රදේශවල වොෂිංටනයේ මෙහෙයුම් මත ඇති කල හැකි බලපෑම පිලිබඳ ක්ෂනික උත්සුකතා මගිනි.

කාටූන් පල කිරීම ආරක්ෂා කරන සමහරු කියා පාන්නේ ඒවා උපහාසය පිලිබිඹු කරන බව කි -- එනම්, නීචම හා උන්මත්තකම ආවේගයන්ට කෙරෙන අශිෂ්ට ආයාචනා අව්‍යාජ සමාජ හෝ සංස්කෘතික විවේචනවලට සම කල හැකිවාක් මෙනි. තථ්‍ය වසයෙන් ගත් කල, යුරෝපීය පුවත්පත් පිටු මත අලවන ලද හා රූපවාහිනී ප්‍රවෘත්ති වැඩසටහන් මගින් විකාශනය කෙරුනු පින්තූර උපහාසාත්මක ඒවා වනවාට වඩා නාසීන් විසින් කුප්‍රකට බවට පත් කෙරුනු යුදෙව් විරෝධී විකට චිත්‍රවලට සමාන වේ.

එවන් හැඟීම් ප්‍රකාශ කිරීම්වලට ආගමික විශ්වාසයන්ට විරුද්ධව නිර්-ආගමිකවාදය සඳහා වන අරගලයක් සමග මොන යම් හෝ සම්බන්ධයක් තිබිය හැකැයි යන්න විකාරයකි. ආගම පිලිබඳ අව්‍යාජ විවේචනයක් සිදු කල හැක්කේ, අවිද්‍යාවට හා භීතියට නොව විද්‍යාවට හා හේතුවාදයට ආයාචනා කරමින්, ඉහලම බුද්ධිමය මට්ටමක පමනි.

සියලු ම ධනපති රටවල ප්‍රජාතන්ත්‍රවාදයේ පැහැදිලි කුනුවීම හේතු කොට ගෙන කම්කරු පන්තිය මුහුන දෙන දරුනු අන්තරායන් වත්මන් සිද්ධිය මගින් එලිදරව් කෙරෙයි. මුස්ලිම් විරෝධී ස්වෝත්තමවාදය සහ සියලු ම ආකාරයේ වාර්ගික හා ජාතිකවාදී විෂ ප්‍රචාරය කිරීම වනාහි විසඳාගත නොහැකි අර්බුදයක ගිලී ඇති හා පුලුල් මහජනතාවගේ අති මූලික ම අවශ්‍යතා සපුරාලීමේ අපොහොසත් සමාජ ක්‍රමයක ප්‍රකාශනයයි.

එවන් පසුගාමී හා ප්‍රතිගාමී දේශපාලනයන් පරාජය කල හැකි එකම මාවත වන්නේ, යුද්ධයට එරෙහිව ද ධනපති පාලක ප්‍රභූන්ටත් ඔවුන් ආරක්ෂා කරන සමාජ ක්‍රමයටත් විරුද්ධව ප්‍රජාතන්ත්‍ර අයිතීන් රැක ගැනීම පිනිස ද සියලු ම රටවල කම්කරුවන්ගේ ඒකාබද්ධ ව්‍යාපාරයක් වර්ධනය කිරීම යි. එවන් අරගලයක් පාදක කල යුතු ක්‍රියාමාර්ගය වනාහි සමාජවාදී ජාත්‍යන්තරවාදයයි.

© www.wsws.org